# ව්‍යවසායකත්ව අධ්‍යයනය

② 

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 11ශ්‍රේණිය
## අලෙවි සැලැස්ම

**1 කොටස**

පහත සඳහන් ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

1) ව්‍යාපාරයක ඉලක්ක වෙළෙඳපොල හා ඉලක්ක වෙළෙඳපොළට ළඟා වන ආකාරය දැක්වෙන ලේඛණය වන්නේ,
   (1) නිෂ්පාදන සැලැස්ම යි
   (2) විකුණුම් සැලැස්ම යි
   (3) අලෙවි සැලැස්ම යි
   (4) මූල්‍ය සැලැස්ම යි

2) විකුණුම් පුරෝකථන ඇතුළත් වන්නේ කුමන සැලැස්මක ද ?
   (1) අලෙවි සැලැස්මෙහි ය
   (2) පරිපාලන සැලැස්මෙහි ය
   (3) මූල්‍ය සැලැස්මෙහි ය
   (4) නිෂ්පාදන සැලැස්මෙහි ය

3) අලෙවි මිශ්‍රයේ ප්‍රධාන විචල්‍යයන් වනුයේ,
   (1) නිෂ්පාදිතය , මිල , ආදේශක , වට්ටම්
   (2) නිෂ්පාදිතය , මිල , ස්ථානය , ප්‍රවර්ධනය
   (3) නිෂ්පාදිතය , මිල , ස්ථානය , වට්ටම්
   (4) නිෂ්පාදිතය , මිල , ප්‍රචාරණය , වට්ටම්

4) අලෙවිකරණ උපාය මාර්ග තීරණය කිරීම සඳහා සලකා බැලිය යුත්තේ,
   (1) මිල පිළිබඳ විශ්ලේෂණය යි
   (2) වෙළෙඳපොළ විශ්ලේෂණය යි
   (3) තරඟකරුවන් පිළිබඳ විශ්ලේෂණය යි
   (4) නිෂ්පාදන විශ්ලේෂණය යි

5) වෙළෙඳපොළට ඉදිරිපත් කරන භාණ්ඩ හෝ සේවාවලට ඉල්ලුමක් ඇති කර ගැනීමට ද, පවතින ඉල්ලුම වැඩි කර ගැනීමට ද, ඉලක්ක පාරිභෝගිකයා ආකර්ෂණය කර ගැනීමට ද, භාවිතා කරන උපක්‍රම අයත් වන අලෙවිකරණ මිශ්‍රය වනුයේ,
   (1) නිෂ්පාදිත මිශ්‍රයයි
   (2) පිරිවැය මිශ්‍රයයි
   (3) ප්‍රවර්ධන මිශ්‍රයයි
   (4) ස්ථාන මිශ්‍රයයි

6) ඉදිරි නිශ්චිත කාලයක දී ව්‍යවසායකයා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට අපේක්ෂිත භාණ්ඩ හෝ සේවා ප්‍රමාණය තීරණය කිරීම ,
   (1) අලෙවි දැක්ම යි
   (2) වෙළෙඳපොළ පුරෝකථනය යි
   (3) විකුණුම් පුරෝකථනය යි
   (4) වෙළෙඳපොළ විශ්ලේෂණය යි

7) ව්‍යාපාරය හා බැඳුනු වෙළෙඳපොළ පිළිබඳ ව විමසා බැලීම

(1) පරිසර විශ්ලේෂණය යි
(2) වෙළෙඳපොළ විශ්ලේෂණය යි
(3) වෙළෙඳපොළ සමීක්ෂණය යි
(4) විකුණුම් පුරෝකථනය යි

8) භාණ්ඩයක හැඩය, ගුණත්වය ,ප්‍රමාණය වැනි තොරතුරු ඇතුළත් වන්නේ අලෙවිකරණ මිශ්‍රයේ කුමන විචල්‍යයක් යටතේ ද ?

(1) මිල
(2) නිෂ්පාදිතය
(3) ස්ථානය
(4) ප්‍රවර්ධනය

## 2 කොටස

❖ නාගරික ප්‍රදේශයක ජීවත් වන සමදරා කේක් සෑදීමේ පාඨමාලාව සාර්ථකව නිම කළ තරුණියකි. සිය පියාගේ ද සහයෙන් කේක් නිපදවා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තීරණය කළ ඇය ඒ සඳහා ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමට තොරතුරු රැස් කර ගන්නා ලදී.
එම ලබා ගත් තොරතුරු අනුව කේක් සම්බන්ධ වෙළඳපොළේ දෛනික ඉල්ලුම පහත පරිදි වේ.

| කේක් වර්ගය | දෛනික ඉල්ලුම(kg) | ඒකක මිල (රු.) |
|---|---|---|
| වැනිලා | 200 | 300 |
| චොකලට් | 100 | 350 |
| පළතුරු | 50 | 450 |

දැනට පවතින ඉල්ලුමෙන් 10% අත්පත් කර ගැනීමට සමදරා තීරණය කරන ලදී. ඒ සඳහා රු. 500 000 ක් වටිනා කේක් සෑදීමේ උදුනක් මිලට ගන්නා ලදී. ඇයගේ මාසික අලෙවි වියදම් පහත පරිදි විය.

| | රු. |
|---|---|
| අලෙවි සේවකයාගේ වැටුප | 10 000 |
| අලෙවි ප්‍රවර්ධන වියදම් | 7 000 |
| ඉන්ධන හා සේවා වියදම් | 8 000 |

රු, 600 000 ක් වටිනා ත්‍රීරෝද රථයක් කේක් අලෙවි කිරීමේ කාර්යයට මිල දී ගැනීමට ඇය තීරණය කර ඇති අතර 10% ක් වාර්ෂිකව එය ක්ෂය කළ යුතු බව ද පවසයි.

ඉහත තොරතුරු අනුව සමදරාගේ අලෙවි සැලැස්මට අවශ්‍ය පහත දෑ ගණනය කරන්න. (මසකට දින 30 ක් යැයි උපකල්පනය කරන්න.)

1) කේක් වල මාසික ඉල්ලුම (kg ) වෙන වෙනම සොයන්න.
2) කේක් වල මුළු වාර්ෂික ඉල්ලුමේ වටිනාකම (රු.) කොපමණ ද ?
3) සමදරාගේ ව්‍යාපාරයට අදාළ වාර්ෂික විකුණුම් පුරෝකථනය කොපමණ ද ?
4) ව්‍යාපාරයේ අලෙවි ස්ථාවර වත්කම් වල වටිනාකම කොපමණ ද ?
5) ව්‍යාපාරයේ මුළු වාර්ෂික අලෙවි වියදම කොපමණ ද ?